අග්නියේ උපන් දාසෙන්කැලි මහරජ

හෙළ පුරාතනයේ ධාතුසේන කුමාරයාගේ කතාවේ තෙවන ලිපිය

- නිර්මාණය :- ඩබ්.එන්.ඩී ධනුෂ්ක සංජය -


ධාසෙන් රජු පරතෙරින් ආ චෝලයින් පන්නා දමා රට එක්සේසත් කළේය. රාජ්‍යත්වයට පත් වූ පළමු කොට රජුනට පැවරී තිබූ කාරිය වූයේ ද්‍රවිඩ පාලනයට රට නතුව පැවති කල නැසී ගිය ආර්ථිකය, සශ්‍රීකත්වය, සම්බුද්ධ සසුන නගාසිටුවීමයි. මේ සඳහා රජුගේ සොහොයුරු සලාතිස්සබෝධි කුමරුන්ද බෙහෙවින් දායක විය. ද්‍රවිඩ පාලකයින් සිය පාලන බලය ව්‍යාප්ත කරගැනීමේ පිළිවෙතකින් රාජ්‍ය පාලනය කළ නියාවෙන් එම කාල පරිච්ඡේදයන් තුළ රටේ කිසිඳු සංවර්ධන පිළිවෙතක් සිදුවූ බවට තොරතුරු හමුනොවේ. මෙනිසාවෙන් ධාතුසේන රජුන් රාජ්‍යත්වයට පත්වන විට රට තුළ පැවතියේ දැඩි අගතිගාමී ස්වරූපයකි. කෙසේවෙතත් චොළී පාලන සමය තුළ උනට ඇප උපකාර කරමින් සිටි ගැත්තන් කිසිවෙකුත් කෙරෙහි රජුට මනාපයක් නොවීය. එ බැවින් උන් සතු වූ සියලු වරදාන හා වරප්‍රසාද අහෝසි කොට ඒවා ධාසෙන් රජු සිහසුනේ පිහිටුවීම උදෙසා ඇප කැප වූවන් වෙත ලබා දෙනු ලැබිය. එවැනි උන් රජු කෙරෙහි තබා ගනු ලැබුවේ සුබවාදී ආකල්පයක් නොවේ. එනමුදු සමස්ත රට වැසියා තුටින් පසු විය. පරදේසක්කාර පාලකයින්ගෙන් මිදී රටට දැයට වැඩදායී ජනතාවට කන්දෙන පාලකයකු ලැබීම පිළිබඳ ඔවුහු තුටු වූහ. මේ අන්දමින් රජුට හිතවත් පිරිසක් සේම රජුට හිතවත් නොවූ පිරිසක්ද රට තුළ ඇති විය. කෙසේ හෝ රජු රාජ්‍යත්වයට පත්වීමෙන් අනතුරුව රට තුළ පැවතියේ සමකාමී සශ්‍රීක යුගයකි. රජු ආර්ථිකයත්, බුදු සසුනත් නගා සිටුවීම උදෙසා කැප වී සිය යුතුකම් ඉටු කළහ. ද්‍රවිඩයින් විනාශ කොට තිබූ බෝධිගෘහයද ප්‍රකෘතිමත් කොට, අනුරපුර වනසන ලද වෙහෙර විහාර යළි පිළිසකර කළේය. මහාවංසයට අනුව ප්‍රාදේශීය වෙහෙර විහාර දහ අටක් ඉදිකළ බවද කියැවෙයි.



කලවාපි වෙහෙර (වර්තමානයේ අප අවුකන විහාරය ලෙස හඳුනන පුදබිම), කපණුවල බදුලු වෙහෙර, සල්වාන, අඹවිටිය, අතුරු මෙගිර, හිල්ලවාන, ඇතාල වෙහෙර, රුහුණු මහා වෙහෙර (දැනට අප ලාහුගල මඟුල් මහා විහාරය ලෙසින් හඳුන්වන) ආදී වෙහෙර විහාර ඒ අතර වෙයි. වෙහෙර විහාර ඉදි කරවීමට අමතරව රජුගෙන් තවත් සාශනික මෙහෙයන් රැසක් ඉටුවිය. මහා සෑ තුනෙහි සුණු පිරියම් කොට වජ්‍රචුම්භටක (හෙන වලකන උපකරණ) සවි කළේය. දින පතා දසඅමුණක බත් දන් දින. තුන් සංඝයාවහන්සේලා වෙනුවෙන් බෙහෙවින් සිව් පසයෙන් සංග්‍රහ කළහ. සම්බුදු සසුන සඳහා රජුන් කැප වූසේම බිඳී ගිය කෘෂිකර්මාන්තය නගා සිටුවීම උදෙසාද ලක්දිව පුරා මහා වැව් දහ අටක් හා කුඩා වැව් දහඅටක් ඉදිකරවූ බව ඓතිහාසික මූලාශයන්ගේ සඳහන් වෙයි. වෙහෙර විහාර අතරින් සල්වාණ විහාරය අනුරාධපුර විලච්චිය අභයභූමිය තුළ පිහිටි, නූතනයේ අප විරන්දගොඩ ලෙසින් හඳුන්වන නටබුන් අතර පිහිටා ඇති බැව් එහි ඇති සෙල්ලිපියක් මගින් සනාථ වේ. මීට අමතරව ඉහතින් දැක්වූ හිල්ලවාන විහාරය රෝහණ දේශයේ පිහිටි බැව් තහවුරු වී ඇත. වර්තමානයේ මදුනාගල ආරණ්‍ය සේනාසනයට අයත් පුදබිම එකල මෙලෙසින් බිලවන විහාරය ලෙසින් ප්‍රකටව පැවති බව ඊට නුදුරින් පිහිටි කරඹගල නටබුන් අතර පිහිටි සෙල්ලිපියක සඳහන් වෙයි. තවද ලෝක කීර්තියට පත් අවුකන බුද්ධ ප්‍රතිමා වහන්සේද රජුගේ පාලන සමයේ ඉදි වූවකි. මීට අමතරව කුඩා වෙහෙර විහාරද දහ අටක් කරවා මිහිඳු මහා පෙරහැරද පැවැත්වීය.



මදුනගල ආරණ්‍ය සෙනාසනයට අයත් නටඹුන්



මදුනගල ආරණ්‍ය සෙනාසනයට අයත් නටඹුන්



මගුල් විහාරයේ නටඹුන්



මගුල් විහාරයේ නටඹුන්



වෙරෙන්දගොඩ නටඹුන



වෙරෙන්දගොඩ නටඹුන්



වෙරෙන්දගොඩ නටඹුන්

අවුකන විහාරය



අවුකන විහාරය




අවුකන විහාරය

ධාසෙන් රජු දවස ඉටු වූ තවත් සුවිශේෂී නිර්මාණයක් ලෙස කලා වැව ඉදිකරවීම ප්‍රකට කරුණකි. පෙර කලෙක ධාතුසේන කුමරුන් පැවිදිව සතුරන්ගෙන් සැඟව සිටි කල සතුරන්ගෙන් කුමරුන් රකිනු පිණිස මහනාම හිමියන් කුමරුන් රැගෙන වඩින මග ගෝණ නදියෙන් එතෙර වන විට කුමරුන් අමතා, මේ දිය අප යන්නට ආ මග අවුරන්නා සේ නුඹ රජ බවට පත් වූ කලෙක මෙහි මග අවුරා වැවක් කරව යැයි මහානාම හිමියන් කුමරුන්ට කී බැව් මහාවංශයේ දක්වයි. මේ බැව් සිහි තබාගත් කුමරුන් රජ බවට පත් වූ පසු ගෝණ නදිය අවුරා කලා වැව කරවිය. කලා වැව අක්කර 6380 ක භූමි ප්‍රමාණයක් යොදා ගනිමින් කළ විශිෂ්ට නිර්මාණයකි. නමුත් කලා වැවට යා කර ඇති බලලු වැවද එක් කොට ගත්විට එම අගය ඊටත් ඉහළ අගයකි. කලාවැවෙන් කෙත් බිම් කරා රැගෙන යන ජලයෙන් අක්කර 7000ක පමණ භූමි ප්‍රමාණයක් වගා කෙරෙයි. ජලය ගෙන යෑම සඳහා ඇල මාර්ග තුනකි. බලලු වැව සඳහා තවත් එකකි. මේ අතරින් වඩා වැදගත් වන්නේ යෝධ ඇලයි. එය සැතපුම් පනස් හතරක පමණ දුරක් දක්වා ජලය ගෙන යයි. මෙය අතීත වාරිමාර්ග තාක්ෂණයේ දියුණුව පිළිබිඹු කරනා සුවිශේෂී සලකුණකි. පළලින් අඩි හතලිහකි. එහි බෑවුම පළමු සැතපුම් දහය තුළ සැතපුමක් අඟල් හය බැගිනි. යෝධ ඇළ හරහා තිසාවැව සහ විලච්චිය කෝරළය දක්වා ප්‍රදේශ වලට කෘෂිකර්මාන්තයට අවැසි වගා දිය සපයයි. මීට අමතරව දනා වැව හෙවත් වර්තමානයේ හඳුන්වන පදවිය වැව, සංගමු වැව, මාඑළිය වැව, මානාමතු වැව (වර්තමානයේ මන්නාරම් දිශාවේ පිහිටි යෝධ වැව) ආදි වැව්ද ඉදිකරවා කෘෂිකර්මාන්තය දියුණු කරවීම සඳහාද අමිල දායකත්වයක් රජුගෙන් ලැබිණ.

රජුට කුමාරවරුන් දෙදෙනෙක් විය. රාජ්‍ය සභාවේ පැවතගෙන ආ සිරිත් විරිත් පරිදි යමින් රජුන්ගේ බිසව වැදූ මොග්ගල්ලාන එක් අයෙකි. අනෙකා වයසින් වැඩිමහලු වූ රජුන් රාජාභිශේක ලබන්නට පෙර කල භින්නමාතකව උපන් කස්සප යි. ධාසෙන් රජුන්ට තවත් එක් සුරූපී දියණියක්ද විය. ඇය දුටුවන්ගේ සිත් වසඟ වන්නාවූ මනා රූසපුවක් ලද්දාය. රජු මේ තිදෙනාටම බෙහෙවින් සෙනෙහස් දැක්වීය. ඒ අතරිනුත් දියණියට බෙහෙවින් සෙනෙහෙවන්ත වූවේය. මෙම තතු කෙසේ වෙතත් රජු පිළිබඳ කිසියම් අනවබෝධයක කස්සප කුමරුන් සිටියා විය හැක. තමා සැබෑ රාජ්‍ය උරුමක්කරුවා නොවීමත් රජු තම මව නොවන එකියක් බිසව කොට ගත්තේ යැයි යම් අමනාපයක් කස්සප කුමරුන්ගේ සිත් තුළ පහළ නොවුණා නොවිය හැකිය. නමුත් රජුට එරෙහිව යෑමට තරම් වුවමනාවක් හෝ ශක්තියක් එකළ ඔහුට නොතිබෙනන්නට ඇත. රජු තම දියණියන්ගේ සරණ බන්දනය තම නැගණියගේ පුත් වූ මිගාර හා සිදුකොට දුනි. අනතුරුව ඔහුට රාජකීය සේනාපති තනතුර ලබා දුනි. මිගාර කස්සපගේ හිතවතෙකු විය. දෙදෙනා වයසින් සමාන වූ නිසාවෙන් කිට්ටු බැඳියාවක් දෙදෙනා අතර කුඩා කල පටන් පැවතුණි. නමුත් මිගාර ලද සේනාපති තනතුර නිසාවෙන් එම බැඳියාව යම් පමණකින් හෝ වෙනස් වන්නට ඇත. තමා රජ කුමාරවරුන් යටතේ තනතුරු ලබා හෝ කටයුතු කිරීම ඔහුට මදි පුංචි වී දෝ මේ පිළිබඳ මිගාරයන් රජු හා අමනාපයෙන් පසු විය.

සිව්වැනි ලිපියට.....

